IOM
UN MIGRATION

# ශ්‍රී ලංකාව - පිළිබඳ තොරතුරු පත්‍රිකාව 2023

## 1. සෞඛ්‍ය සේවාව

**සෞඛ්‍ය සේවා පිළිබඳ සාමාන්‍ය තොරතුරු:**

ශ්‍රී ලංකාව මහජන අරමුදලින් නඩත්තු වන නිදහස් සෞඛ්‍ය සේවා ක්‍රමයක් පවත්වා ගෙන යනු ලබන අතර මෙම සේවාව නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් මගින් මෙහෙයවනු ලැබේ. මෙම පොදු සෞඛ්‍ය සේවා පද්ධතිය රාජ්‍ය මුදල් සහ පරිපාලනයෙන් ක්‍රියාත්මක වන රෝහල් පද්ධතියකින් සමන්විත වන අතර මෙය තුළින් බාහිර රෝගී සේවාවන්ගෙන් 50% ක් සහ නේවාසික රෝගීන්ගෙන් 90% ක් හා සියලුම රෝග නිවාරණ සේවා සහ ප්‍රතිකාර අවශ්‍යතා ආවරණය වන පරිදි නොමිලේ පවත්වා ගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය බටහිර ඇලෝපති සහ ආයුර්වේද, සිද්ධ, යුනානි, කටු චිකිත්සාව සහ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික දැනුමෙන් ලබාගත් දේශීය ප්‍රතිකාර වැනි අනෙකුත් ක්‍රමවලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම සපයනු ලබන අතර ලාභ අපේක්ෂාවෙන් තොර වූ ආයතන විසින් සීමිත සේවා සපයනු ලබයි. ඇලෝපති සහ සාම්ප්‍රදායික සෞඛ්‍ය සේවා ක්‍රම සෞඛ්‍ය අමාත්‍යාංශය (MOH) විසින් අධීක්ෂණය කරනු ලබන අතර ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් ඇලෝපති ක්‍රමය තුළින් ප්‍රතිකාර ලබා ගනිති.

පුද්ගලික සෞඛ්‍ය සේවා, මහජන සෞඛ්‍ය සේවා පද්ධතියට සමාන්තරව ක්‍රියාත්මක වන අතර ප්‍රධාන වශයෙන් ගිලන්රථ සත්කාර, නේවාසික ප්‍රතිකාර සහ පුනරුත්ථාපන ප්‍රතිකාර සේවා සපයයි. පුද්ගලික සෞඛ්‍ය සේවා සඳහා සේවාලාභීන්ගේ පුද්ගලික මුදල් සහ පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම තුලින් අරමුදල් සැපයේ. පෞද්ගලික රෝහල් විසින විශේෂඥ වෛද්‍ය උපදේශන සේවා සමඟින් නේවාසික සහ බාහිර රෝගී සේවාවන් සපයනු ලබයි. ශ්‍රී ලංකාව තුළ පුද්ගලික ඔසුසල් සහ රසායනාගාර සේවාවන් පුද්ගලික රෝහල් පරිශ්‍රය තුළ මෙන්ම ස්වාධීන ආයතන ලෙස බාහිරව ද තම සේවා සැපයීම සිදුකරනු ලබයි. පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ වෙළෙඳපොළ පසුගිය වසර තුළ වර්ධනය වී ඇති අතර රක්ෂණ ආවරණ ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්, අලියාන්ස් ශ්‍රී ලංකා සහ සොෆ්ට්ලොජික් ලයිෆ් වැනි ආයතන විසින් සපයනු ලැබේ. ආපසු පැමිණෙන පුද්ගලයින්ට සෑම විටම ශ්‍රී ලංකාවේ මහජන සෞඛ්‍ය පහසුකම් වෙතින් ප්‍රතිකාර ලබා ගැනීමට සහ නොමිලේ ඖෂධ ලබා ගැනීමට හැකියාව තිබේ.

**වෛද්‍ය පහසුකම් තිබීම සහ වෛද්‍යවරුන් සිටීම:**

ශ්‍රී ලංකාව පුරා නගරවල මෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල ද වෛද්‍ය පහසුකම් තිබේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය අංශයේ රෝහල් 1054ක් පිහිටා තිබේ. මේ පිළිබද වැඩි විස්තරසෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන http://www.health.gov.lk/moh_final/english/hospital_government.php?spid=24 වෙතින් ලබා ගත හැක. ශ්‍රී ලංකාවේ නේවාසික රෝගී සත්කාර සේවා සපයන පෞද්ගලික රෝහල් 141 ක් තිබේ. පුද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාව මහජන සෞඛ්‍ය සේවාව මෙන් නොව රෝගින්ට පහසු වේලාවන්හිදී තමන්ට අවශ්‍ය සේවාවන් ලබා ගත හැකි වන අයුරින් හා රජයේ සෞඛ්‍ය සේවා පහසුකම් ලබාගැනීමේ දී මෙන් පොරොත්තු ලේඛනවල සිටීමට සිදුනොවන අයුරින් රෝගීන්ට විශේෂිත ආකාරයෙන් යම් යම් පහසුකම් ලබා දෙනු ලබයි. මීට අමතරව, ආපසු පැමිණෙන පුද්ගලයාට තමන් කැමති වෛද්‍ය විශේෂඥයෙකු තෝරා ගැනීමේ හැකියාව ද ඇති අතර එම වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ අඛණ්ඩව ප්‍රතිකාර ලබා ගැනීමට ද හැකියාවක් පවතී.

## රෝහල්වලට ඇතුලත් කිරීම

පොදු සෞඛ්‍ය සේවාව තුළ, රෝගියාට බාහිර රෝගී අංශයේ ප්‍රතිකාර සඳහා වෛද්‍යවරයකු මුණ ගැසී පරීක්ෂා කරවා ගැනීම සඳහා පැමිණිය හැකි අතර එය සඳුදා සිට සිකුරාදා දක්වා පෙරවරු 07.30 සිට පස්වරු 04.00 දක්වා සහ සෙනසුරාදා පෙ.ව.08.00 සිට පස්වරු 12.00 දක්වා ක්‍රියාත්මක වේ. රෝගියාගේ තත්ත්වය සහ වෛද්‍ය නිර්දේශය මත පදනම්ව, වැඩිදුර ප්‍රතිකාර හෝ පරීක්ෂණ කටයුතු සඳහා එම රෝගියා නේවාසික ප්‍රතිකාර සඳහා රෝහලකට ඇතුලත් කිරීමට නිර්දේශ කරනු ලැබේ. එම අවස්ථාවේ දී, එකී පුද්ගලයා සතුව ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පත හෝ වෙනත් හඳුනාගැනීමේ ලේඛනයක් මෙන්ම වෛද්‍යවරයා විසින නිකුත් කරනු ලබන යොමු කිරමේ සටහනක් තිබිය යුතුය. එවිට රෝගියාට තමන් කැමති රජයේ රෝහලක් නිදහසේ තෝරා ගත හැකි අතර දිවයින පුරා රජයේ රෝහල් පිහිටා තිබෙන බැවින් නේවාසික ප්‍රතිකාරය සඳහා බොහෝ විට රෝගියා ළඟම ඇති රජයේ රෝහල වෙත යාමට තීරණය කරයි. එමෙන්ම, යම් පුද්ගලයෙකු පෞද්ගලික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයකින් වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට තීරණය කරන්නේ නම්, එම ස්ථානයට පැමිණීමට පෙර අදාළ රෝහලේ තමන් කැමති වෛද්‍යවරයා හමුවීම සඳහා වෑනලින් සේවාව ඔස්සේ වේලාවක් වෙන් කරගත යුතුය. පසුව, පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය මත පදනම්ව, අවශ්‍ය වන්නේ නම් එම රෝහලට නේවාසික ප්‍රතිකාර සඳහා ඇතුළත් වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. එවිට පුද්ගලයා සතුව හැඳුනුම් ලේඛනය (උදා, රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය) සහ, වෛද්‍යවරයාගේ යොමු සටහන මෙන්ම ඇතුළත් වීම සඳහා සහ ප්‍රතිකාර වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් තිබිය යුතුය.

## ඖෂධ ලබා ගැනීමේ හැකියාව සහ පිරිවැය

ශ්‍රී ලංකාව නිදහස් හා පොදු සෞඛ්‍ය සේවා ක්‍රමයක් අනුගමනය කරන බැවින් රාජ්‍ය අංශයේ සෞඛ්‍ය මධ්‍යස්ථානවලින් නොමිලේ ඖෂධ ලබා ගත හැක. කෙසේ වෙතත්, ඇතැම් නිර්දේශිත ඖෂධ හෝ ප්‍රතිකාර ලබා ගත නොහැකි නම්, රෝගීන් පෞද්ගලික ඔසුසලකින් තමන්ගේ වියදමින් ඖෂධ මිලදී ගැනීමට හෝ අදාල ප්‍රතිකාරය පෞද්ගලික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයකින් ලබා ගත හැකි නම් එසේ ලබා ගැනීමට කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වේ. මීට අමතරව, රෝගියා පෞද්ගලික සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානයක වෛද්‍යවරයෙකුගෙන් වෛද්‍ය උපදෙස් ලබා ගැනීමට තීරණය කරන්නේ නම්, ඖෂධ, ප්‍රතිකාර සහ වෙනත් පරීක්ෂණ සේවා සඳහා සිදුවන වියදම් එම පුද්ගලයා විසින් දැරිය යුතුය.

(සටහන: 2022 ආරම්භයේ සිට, පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ අත්‍යාවශ්‍ය ඖෂධවල සැලකිය යුතු හිඟයක් ඇති විය. ආනයන ප්‍රමාදයන් සහ ප්‍රතිකාර සඳහා වැය වන වියදම් ඇතුළුව විටින් විට මිලෙහි විශාල වෙනස්කම් සිදු වෙමින් තිබේ. පුද්ගලයෙකුට පුද්ගලික සෞඛ්‍ය රක්ෂණයක් නොමැති තත්වයක් තුළ පුද්ගලික සෞඛ්‍ය සේවා ආයතනයකින් බෙහෙත් ලබා ගැනීමට එම පුද්ගලයා කැමැත්තක් දක්වන්නේ නම්, සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් එම පුද්ගලයා විසින් දැරීමට සිදුවේ)

## කොවිඩ්-19 පිළිබඳ සාමාන්‍ය තොරතුරු

2023 වනවිට ශ්‍රී ලංකාව තුල **කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්පූර්ණයෙන් මැඩපවත්වන ලදී. 2022 දෙසැම්බර් මස අවසන් වන**විට වාර්තාගත රෝගීන් සංඛ්‍යාව අවම වූ අතර මරණ සංඛ්‍යාව බින්දුව දක්වා පහත වැටිනි. **වසංගත කාලය තුල** ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් බොහෝ තොරතුරු අඩංගු ලේඛණ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් සම්පාදනය කරන ලදී. සෞඛ්‍ය අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවේ නව ආසාදිතයින්, මරණ සහ සුවය ලැබූ මුළු සංඛ්‍යාව ආදී සංඛ්‍යා ලේඛණ සමඟින් දෛනිකව ශ්‍රී ලංකාවේ සජීවී තත්ව විශ්ලේෂණය ගෙනහැර දක්වනලදී. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ *https://www.hpb.health.gov.lk/en/covid-19* වෙබ් අඩවිය තුළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරන ලද කොවිඩ්-19 ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. මීට අමතරව, මෙම වෙබ් අඩවිය තුළ මෙම වසංගතය වැළැක්වීමේ පියවරයන්, විශේෂ සෞඛ්‍ය අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා උපදෙස්, කොවිඩ්-19 ආශ්‍රිත සේවාවන් සඳහා තිබෙන්නාවූ රෝහල් සහ රසායනාගාර තොරතුරු සහ සාමාන්‍ය ජනතාව සඳහා වන වෙනත් තොරතුරු සමඟින් මහජනයාට තමන් සහ

අන් අය ආරක්ෂා කර ගත හැකි ආකාරය පිළිබඳ තොරතුරු ඇතුලත් වේ. එමෙන්ම සෞඛ්‍ය අමාත්‍යංශය විසින් කොවිඩ්-19 රෝග ලක්ෂණ පිළිබඳව මහජනතාවට නොමිලේ වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා 1390 හදිසි ඇමතුම් අංකය ස්ථාපිත කොට ත

ශ්‍රී ලංකාවට ගමන්කරන සම්පූර්ණයෙන්ම එන්නත් කරන ලද විදේශීය සංචාරකයින් පිටත්වීමට පෙර සිදුකර ගත යුතු කොවිඩ්- 19 පරීක්ෂාවෙන් නිදහස් කර ඇති අතර නිරෝධායනයට ලක් වීම ද අවශ්‍ය නොවේ.

සෞඛ්‍ය අමාත්‍යංශය විසින් නිකුත් කරනු ලැබූ නවතම කොවිඩ්-19 මාර්ගෝපදේශයන්ට අනුව රටතුලට ඕනෑම ගුවන් තොටුපලක් හෝ වරායක් හරහා ) පැමිණෙන සංචාරකයින් කොවිඩ්- 19 එන්නත් සහතිකය ඉදිරිපත් කලයුතු නොවේ.

තවද ඕනෑම ගුවන් තොටුපලක් හෝ වරායක් හරහා ශ්‍රී ලංකාවට පැමිණෙන ඕනෑම පුද්ගලයෙකු විසින් ගොඩබෑමට පෙර හෝ පැමිණීමෙන් පසු හෝ කොවිඩ්- 19 රෝගය නොමැති බව තහවුරු කරන නිශේධක පරීක්ෂණ  ප්‍රතිඵලය ඉදිරිපත් කලයුතු නොවේ.

**ආපසු පැමිණෙන්නන් සඳහා වූ අවස්ථා**

**සුදුසුකම් සහ අවශ්‍යතා**: ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට දිවයින පුරා පිහිටා තිබෙන පොදු සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන එනම් රෝහල්වලින් සෞඛ්‍ය පහසුකම් නොමිලේ ලබා ගත හැක. මහජන සෞඛ්‍ය සේවා පද්ධතියෙන් නේවාසික සහ බාහිර රෝගී සේවාවන් ලබා ගැනීම සඳහා රක්ෂණයක් අවශ්‍ය නොවේ. ආපසු පැමිණෙන්නන් සෘජුවම තමන් කැමති රෝහල වෙත ගොස් ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකාර වහාම ආරම්භ කළ හැකිය. ආපසු පැමිණෙන්නන් පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ ආවරණයකට කැමත්තක් දක්වන්නේ නම්, ඔවුන් සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම සපයන රක්ෂණ ආයතනයක් යටතේ ලියාපදිංචි විය යුතු අතර කොන්දේසි සමාගම් අනුව වෙනස් විය හැක.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය:** මහජන සෞඛ්‍ය සේවා පද්ධතිය යටතේ සේවාවන් ලබා ගැනීමට නැවත පැමිණෙන තැනැත්තාට කිසිදු ස්ථානයක ලියාපදිංචි වීමට අවශ්‍ය නොවේ. පුද්ගලික රක්ෂණ සමාගම් දිවයිනේ බොහෝ දිස්ත්‍රික්කවල සිය ශාඛා පිහිටුවා ඇති අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය සමාගම් අනුව වෙනස් විය හැක. වඩාත්ම කැපී පෙනෙන පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ සමාගම් ඉහත සඳහන් කර ඇත. නිශ්චිත ක්‍රියා පටිපාටිය, අවශ්‍යතා සහ මිල ගණන් ඔවුන්ගේ වෙබ් අඩවිවල පළකර තිබේ.

**අවශ්‍ය ලියකියවිලි:** රෝහලකට ඇතුළත් කිරීමට හෝ වෙනත් ප්‍රතිකාර ලබා ගැනීමට ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය සහ වෛද්‍ය වාර්ථා අවශ්‍ය වේ.

# 2. ශ්‍රම වෙළඳපොළ

**ශ්‍රම වෙළඳපොළ පිළිබඳ සාමාන්‍ය තොරතුරු:**

2021 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන *22.16* ක් වූ අතර 2019 දී මිලියන 8.592 ක් වූ ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය 2020 දී මිලියන 8.467 දක්වා පහත වැටුණි. ඒ අනුව 2020 දී ආර්ථික වශයෙන් රටේ අක්‍රිය ජනගහනය මිලියන 0.125 කින් ඉහළ ගොස් ඇත. කොවිඩ් -19 වසංගතය පැතිරීම මධ්‍යයේ පැවති සීමාවන්, රැකියා අවස්ථා සීමා වීම සහ කොවිඩ් - 19 ව්‍යාප්තිය හේතුවෙන් දක්නට ලැබූ සෞඛ්‍ය අවදානම් තත්වයන් යනාදිය කරණකොටගෙන බොහෝ දෙනෙකුට රැකියා අහිමි වූ බැවින් මෙම තත්වය උද්ගත විය. පුරුෂ ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 71.9% දක්වා පහත වැටුණු අතර කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 32.1% දක්වා පහත වැටුණි. කොවිඩ් -19 වසංගතය ශ්‍රම බලකායේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතාවයන් තීව්‍ර කර ඇත. 2020 දී රැකියාවේ නියුක්ත ජනගහනය මිලියන 7.99 දක්වා අඩු වූ ඇති අතර තාවකාලික සහ අනියම්

සේවා කාණ්ඩවල කැපීපෙනෙන පහත වැටීමක් නිරීක්ෂණය විය. 2020 තුන්වන කාර්තුවේදී විරැකියා අනුපාතය 5.8% දක්වා ඉහළ ගොස් ඇත. කොවිඩ්-19 හේතුවෙන් පනවා ඇති ආනයන සීමා කිරීම් සහ ආහාර සැපයුමට එල්ලවූ බාධා හේතුවෙන් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෘෂිකර්ම අංශයේ රැකියා ඉහළ ගොස් ඇත. ප්‍රමුඛතම රැකියා උත්පාදක ක්ෂේත්‍රය වන කර්මාන්ත හා සේවා නියුක්තිය 2020 දී 26.9% දක්වා පහත වැටී ඇත. වසංගතය තුළ මතු වූ නව ඉල්ලීම් සමඟ පුද්ගලික ආරක්ෂක උපකරණ :ඡඡෑ) නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයින්, බෙදා හැරීමේ සේවකයින් වැනි නව රැකියා නිර්මාණය වී ඇත. 2020 දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන රැකියා උත්පාදක ක්ෂේත්‍රය වූයේ පුද්ගලික අංශයයි. රැකියා අවස්ථා නිර්මාණය කර ඇති වැදගත්ම ක්ෂේත්‍ර ලෙස කෘෂිකර්මය, නිෂ්පාදන, ඉදිකිරීම්, පතල් කැණීම් සහ ගල් කැඩීම සහ පොදු උපයෝගිතා යනාදිය හඳුනාගත හැක. 2020 දී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (GDP) ඇමෙරිකානු ඩොලර් 4052.75 ලෙස වාර්තා වූ අතර එය ලෝක සාමාන්‍යයෙන් 32% ට සමාන වේ. මේ වන විට ශ්‍රී ලංකාව දැඩි ආර්ථික අර්බුදයකට ලක්වී ශ්‍රී ලංකා රුපියල දැඩි අවප්‍රමාණයකට ලක්ව ඇති අතර එය බොහෝ රැකියා හා ක්ෂේත්‍රවලට අහිතකර ලෙස බලපානු ඇත.

**රැකියා සොයා ගැනීම:**

විදේශ රැකියා සොයා ගැනීමට ජනයා උනන්දු වන්නේ නම්, ඔවුනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) වෙත ගොස් බලපත්‍රලාභී බඳවා ගැනීමේ නියෝජිතයින් හරහා රැකියා ලබා ගත හැකිය. වැඩිදුර විස්තර *http://www.slbfe.lk/* ඔස්සේ ලබාගත හැක.

දේශීය රැකියා අවස්ථා වෙබ් අඩවි, පුවත්පත්, යෙදුම් ආදී මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කරනු ලබන අතර පහත සඳහන් මාධ්‍ය ඇතුළුව සමාජ මාධ්‍ය වේදිකාවල ප්‍රචාරණය කරනු ලැබේ.

- https://topjobs.lk/
- https://xpress.jobs/
- https://www.careerfirst.lk/
- https://www.dreamjobs.lk/

**විරැකියාව තුරන් කිරීම සඳහා සහය ලබා දීම**

ශ්‍රී ලංකා වෘත්තීය මාර්ගෝපදේශන ආයතනය 2019 දී ආරම්භ කරන ලද්දේ විරැකියාව අවම කිරීම සඳහා දිවයින පුරා සිටින වයස අවුරුදු 13 ත් 35 ත් අතර තරුණ තරුණියන්ට වෘත්තීය මාර්ගෝපදේශන සේවාවක් සැපයීම සඳහා ය. මෙම ආයතනය තරුණයින්ට වෘත්තීය තේරීම්, වෘත්තිය වෙනස්කර ගැනීම, වෘත්තීය සැලසුම් කිරීම යනාදී කරුණු සඳහා සහාය ලබාදෙයි. ආයතනය හා සම්බන්ධ වීමට අදාල තොරතුරු වෙබ් පිටුවේ සඳහන් කර ඇති අතර, වැඩිදුර විස්තර *http://slicg.gov.lk/slicg/* ඔස්සේ ලබා ගත හැක. ශ්‍රී ලංකාවේ ජනයාට රැකියා අහිමි වූ විට ක්‍රියාත්මක වන රැකියා ප්‍රතිලාභ යෝජනා ක්‍රම නොමැත. කෙසේ වෙතත්, දිළිඳු හා රැකියා විරහිත පුද්ගලයින් කෙරෙහි අවධානය යොමු කරමින් රජය විසින් සමෘද්ධි නම් දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහනක් ආරම්භ කර ඇති අතර එහිදී සුදුසුකම්ලත් පවුල් සඳහා ආහාර මුද්දර සහ ව්‍යාපාරික සහාය සඳහා ණය මුදල් ලබා දෙනු ලැබේ. ආධාර සඳහා සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින පුද්ගලයින් පමණි. ආපසු පැමිණෙන පුද්ගලයින්ට *https://www.samurdhi.gov.lk/* මගින් වැඩි විස්තර ලබා ගත හැක. සමස්තයක් වශයෙන්, කුසලතා සහ පළපුරුද්ද මත පදනම්ව රැකියා අවස්ථාවක් සොයා ගැනීම පුද්ගලයාගේ වගකීමකි.

**වැඩිදුර අධ්‍යාපනය සහ පුහුණුව:**

උසස් අධ්‍යාපනය ලැබීමට රාජ්‍ය විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල තිබේ. උසස් පෙළ (උ/පෙළ) විභාගයේ ලකුණු ලබා ගැනීම මත පදනම්ව තෝරාගත් සිසුන් සංඛ්‍යාවකට පමණක් රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදීරීම සඳහා අවසරය ලැබේ. පුද්ගලික විශ්ව විද්‍යාලවලට ප්‍රවේශය ලබා ගැනීම සඳහා ශිෂ්‍යයෙකු අ.පො.ස. සාමාන්‍ය පෙළ (සා.පෙළ) හෝ අ.පො.ස. උසස් පෙළ

විභාගය හෝ ජාත්‍යන්තරව පිළිගත් වෙනත් විභාගයකින් සමත් වී සිටිය යුතුය. පිළිගත් පෞද්ගලික විශ්ව විද්‍යාල ලැයිස්තුව පහත යොමුවෙන් සොයා ගත හැක.

*https://www.mohe.gov.lk/index.php?option=com_content&view=article&id=117&Itemid=206&lang=en.*

තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන අංශය ව්‍යවහාරික විෂයයන් සඳහා වන උපාධි සඳහා කෙටිකාලීන සහතික වැඩසටහන් සහ ආධුනිකත්ව පුහුණුව සපයයි. මෙම ආයතන ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (හඳුත) යටතේ ජාතික සහතික, ජාතික ඩිප්ලෝමා සහ 7 මට්ටමේ උපාධි පිරිනමයි. මේවා පහත ආයතන විසින් පිරිනමනු ලබන අතර ලියාපදිංචිය සහ අවශ්‍යතා පිළිබඳ වැඩිදුර තොරතුරු පහත සබැඳි හරහා ලබා ගත හැක.

- තාක්ෂණික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව *(DTET)- http://dtet.gov.lk/en/*
- තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව *(TVEC) – https://www.tvec.gov.lk/*
- වෘත්තීය පුහුණු අධිකාරිය *((VTA) – https://wenr.wes.org/2017/08/education-in-sri-lanka*
- ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරිය *(NAITA) – http://www.naita.gov.lk/*
- ලංකා ජර්මන් තාක්ෂණික පුහුණු ආයතනය *(CGTTI) – http://www.cgtti.lk/*
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය *(OUSL) – https://ou.ac.lk/*
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය *(UoVT) – http://univotec.ac.lk/*

අ.පො.ස. සාමාන්‍ය පෙළ (සා.පෙළ) සමත් වයස අවුරුදු 17ට වැඩි සිසුන් මෙම බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර තාක්ෂණික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් යටතේ බොහෝ පාඨමාලා සඳහා අවුරුදු 29 ක වයස් සීමාවක් ඇත. වෘත්තීය පුහුණු අධිකාරිය විසින් පිරිනමනු ලබන පාඨමාලා හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන් වසර 9 ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කර තිබීම අවශ්‍ය වන අතර ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරිය යටතේ ඇති බොහෝ පාඨමාලා සඳහා ඇතුළත් වීම සඳහා අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් වී තිබිය යුතු නමුත් 8 ශ්‍රේණිය සම්පූර්ණ කර ඇති අභ්‍යාසලාභීන් සඳහාද විවෘත පාඨමාලා තිබේ. ආපසු පැමිණෙන අය රැකියා අවස්ථා සඳහා නැවත සංක්‍රමණය වීමට අදහස් කරන්නේ නම්, ඔවුන්ට NVQ III මට්ටමේ අවම ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටමක් තිබිය යුතුය. NVQ හි පියවර 7ක් ඇති අතර 7 වන පියවරය උපාධියකට සමාන වේ.

**ආපසු පැමිණෙන්නන් සඳහා වන අවස්ථා**

**සුදුසුකම් සහ අවශ්‍යතා**: වයස් සීමාව සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇත්නම්, ආපසු පැමිණෙන්නන් වෙළඳාම, කර්මාන්ත, නිෂ්පාදන ක්ෂේත්‍රවල හෝ ව්‍යවසායකත්වයේ රැකියාවක් ලබා ගැනීමට වැඩිදුර පුහුණුවීම් සහ සුදුසුකම් ලබා ගැනීම සඳහා කාර්මික සහ වෘත්තීය අධ්‍යාපන අංශයේ පාඨමාලා සඳහා සම්බන්ධ විය හැකිය. විවිධ විෂයයන් පිළිබඳව වෘත්තීය/පුහුණු පාඨමාලා සපයන තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු (ඔඬෑඔ) ආයතන හයක් ඇත. ආපසු පැමිණෙන්නන්ට මෙම ආයතනවල වෙබ් අඩවිවලට (වැඩිදුර අධ්‍යාපනය සහ පුහුණුව යටතේ සඳහන් කර ඇත) ප්‍රවේශ වී සුදුසු වෘත්තීය පාඨමාලාවක් තෝරා ගත හැකිය. පෙර ඉගෙනීම පිළිගැනීමට ලක්කිරීම ඔවුන්ගේ කුසලතා සහ අතීත සේවා පළපුරුද්ද ප්‍රදර්ශනය කිරීම ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලබා ගැනීමේ මාර්ගයක් වනු ඇත. පෙර සේවා පළපුරුද්ද ඇති ආපසු පැමිණෙන පුද්ගලයින්ට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබා ගැනීම සඳහා පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය නොවන අතර ඒ වෙනුවට ඔවුන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රය හා සම්බන්ධ පළපුරුද්ද පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකට මුහුණ දීමට සිදුවේ. නිපුණතාවය සහ කුසලතාවය මත පදනම්ව, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම පිරිනමනු ලබන අතර, ආපසු පැමිණෙන පුද්ගලයින්ගේ ක්ෂේත්‍රය අනුව රුපියල් 7000-15000 අතර වියදමක් දැරීමට සිදුවේ. *NAITA, DTET* සහ *VTA* වෙතින් *RPL* ලබා ගත හැකි නමුත් *RPL* සහතිකය ලබා ගත හැකි ප්‍රමුඛතම ආයතනය ලෙස *NAITA* අධිකාරිය සලකනු ලැබේ.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය**: ආපසු පැමිණෙන පුද්ගලයින් සඳහා ලියාපදිංචි වීමට විරැකියාව තුරන් කිරීමේ සහය වැඩසටහන් කිසිවක් නොමැති නමුත් දිළිඳුකම පිටුදැකීමේ සමෘද්ධි වැඩසටහන් සඳහා ඇති සුදුසුකම් පිළිබඳව අදාළ ග්‍රාම සේවක නිලධාරිවරයාගෙන් විමසා කරුණු දැනගත හැක. මීට අමතරව, රැකියා අවස්ථා සෙවීම, වෘත්තිය සැලසුම් කිරීම සහ හොඳම රැකියා අවස්ථාව තෝරාගැනීම සඳහා උපදෙස් ශ්‍රී ලංකා වෘත්තීය මාර්ගෝපදේශන ආයතනය විමසා කරුණු දැනගත හැක. මෙම ආයතනය වයස අවුරුදු 13 සිට 25 දක්වා තරුණයින් සඳහා පමණක් සේවා සපයන නමුත් ව්‍යතිරේකයක් ලෙස අවුරුදු 35 දක්වා පුද්ගලයින්ටද සේවා සපයයි.

**අවශ්‍ය ලියකියවිලි**: රැකියාවක් සොයන විට, හදුනාගැනීම සඳහා වන ලේඛණ, අධ්‍යාපන සුදුසුකම්, රැකියා පළපුරුද්ද තහවුරු කිරීම සහ නැවත ආරම්භ කිරීම සඳහා වන ලිපි යනාදිය තමා සතුව තිබීම වැදගත් වේ.

## 3. නිවාස

**නිවාස පිළිබඳ සාමාන්‍ය තොරතුරු**:
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් 2016 වසරේ සිදු කරන ලද නිවාස අවශ්‍යතා තක්සේරු කිරීමේ සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ ජීවත් වන පවුල් මිලියන හයෙන් මිලියන 5.2කට පමණක් යම් ආකාරයක නිවාසයක් තිබේ. ප්‍රමාණවත් සහ දැරිය හැකි මිලකට නිවාස ලබාදීම ශ්‍රී ලංකාවේ නිවාස අංශයේ ප්‍රධාන ගැටලුවකි. මෙම ප්‍රශ්නයට වැඩිපුරම මුහුණ දෙන්නේ අඩු ආදායම්ලාභී පවුල්වල අයවලුන්, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ප්‍රජාවන්, ආපදා සිදුවිය හැකි අවදානම් ප්‍රදේශවල ජීවත් වන ජනතාව සහ නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වන මැදි ආදායම් ලබන කණ්ඩායම් ය. මූල්‍යමය ගැටළු සහ අක්‍රමවත් රැකියා හේතුවෙන් නිවාස ණය ලබා ගැනීමේ හැකියාව ඇත්තේ 20%කට පමණි. නාගරික අංශයේ කුටුම්භවලින් 88.3% කට ආසන්න ප්‍රමාණයක් තනි නිවාසවල ජීවත් වන අතර 30.6% ක් වතු අංශයේ තනි නිවාස හෝ ලයින් කාමර, පේළි නිවාස සහ ද්විත්ව බද්ධ නිවාසවල ජීවත්වන අතර සාමාජිකයින් විශාල සංඛ්‍යාවක් එකම නිවස තුළ ජීවත්වෙති. නාගරික ප්‍රදේශයේ තනි නිවාසවල ප්‍රතිශතය ඉහල අගයක් පෙන්නුම් කරන අතර වැඩිවන කුලී සහ ඒ ආශ්‍රිත වියදම් හේතුවෙන් බොහෝ දෙනා නවාතැන් බෙදා ගනිමින් ජීවත් වීමට කැමැත්තක් දක්වයි. නිවසක කාමර සංඛ්‍යාව, පිහිටා ඇති ස්ථානය සහ සපයා ඇති පහසුකම් අනුව කුලිය තීරණය වේ. කෙසේ වෙතත්, නාගරික ප්‍රදේශයේ කාමර 2 කින් යුත් නිවසක සාමාන්‍ය කුලිය රු. 35,000 ක් වන අතර ග්‍රාමීය ප්‍රදේශවල රු. 20,000 ක් පමණ වේ. වර්තමානයේ ආර්ථික අර්බුදය හේතුවෙන් විදුලිය සහ අනිකුත් සේවා බිල් මත පනවා ඇති බදු මුදල 100%න් ඉහළ ගොස් ඇති අතර ඒ අනුව උපයෝගිතා බිල්පත් පරිභෝජනය මත පදනම්ව සාමාන්‍යයෙන් ජලය සහ විදුලිය සඳහා රුපියල් 8000ක් වෙන් කළ යුතුයි. නාගරීකරණය වූ ප්‍රදේශවල බොහෝ රැකියා අවස්ථා පවතින බැවින් නාගරික ප්‍රදේශවල නිවාස සහ දේපල සඳහා ඉල්ලුම වැඩි වී ඒවායේ කුළියද වැඩි වී ඇත. තමන්ගේම නිවසක් තනා ගැනීම සඳහා ඉතා අධික වැය බරක් දැරීමට සිදුවන බැවින් බොහෝ අයවලුන් නාගරික හා ග්‍රාමීය ප්‍රදේශවල නිවාස කුලියට ගැනීමට අපේක්ෂා කරති.

**නවාතැන් සොයා ගැනීම**:
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නිවාස ගැටලුවට මුහුණ දෙන ප්‍රජාවන්ට සහාය දක්වයි. ප්‍රධාන වශයෙන් වතු ලයින් කාමරවල ජීවත් වන දිළිඳු පවුල්, ග්‍රාමීය අඩු ආදායම්ලාභී පවුල් සහ ස්ථිර නිවසක් හෝ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නාගරික අඩු ආදායම්ලාභී පවුල් සඳහා මෙම අධිකාරිය සහය ලබා දෙයි. නාගරික සංවර්ධන අධිකාරිය, කොළඹ මහනගර කලාපය, මහනුවර, රත්නපුර, අනුරාධපුර සහ බොහෝ විට සීමිත සහ ඉතා මිල අධික ඉඩම් සහිත අනෙකුත් ප්‍රධාන නාගරික ප්‍රදේශවල මැදි ආදායම් ලබන පවුල්වලට දැරිය හැකි මිලකට නිවාස ආධාර ලබා ගැනීමට සහාය වේ. කුලියට ගැනීම සඳහා දැන්වීම් පළකර ඇති මහල් නිවාස සහ අනෙකුත් නිවාස පිළිබඳ තොරතුරු පුවත්පත් සහ පහත සඳහන් වෙබ් අඩවි වලින් සොයාගත හැකිය.

- https://ikman.lk/en/ads/sri-lanka/house-rentals
- https://www.patpat.lk/property/house
- https://www.lankapropertyweb.com/rentals/index.php

**නිවාස සඳහා සමාජ ආධාර:**
නිවාස සඳහා ශ්‍රී ලංකාවේ සමාජ ආධාර නොමැත, බැංකුවලින් නිවාස ණය ලබා ගැනීමට අපහසු බැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අඩු සහ පහළ මධ්‍යම ආදායම්ලාභී පවුල් සඳහා රුපියල් 500,000. නිවාස ණයක් ලබා දෙයි. මෙම ණය මුදල ලබා ගැනීම සඳහා පවුලේ මාසික ආදායම රු. 45,000 ක් විය යුතු අතර වයස අවුරුදු 55 ට අඩු විය යුතුය, සැබෑ නිවාස අවශ්‍යතාවය සහ පෙර සූදානම මෙන්ම නිවාස සඳහා සුදුසු ඉඩමක් තිබිය යුතුය. අයදුම්පත ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත නිවාස නිලධාරීන්ගෙන් ලබාගත හැක. මේ සඳහා ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා ලියකියවිලි, ආදායම් සහතිකය, පළාත් පාලන ආයතනයේ නිවස අනුමත කිරීමේ සැලැස්ම, ඇපකරුවන්ගේ ප්‍රකාශය සහ අයදුම්පතෙහි සඳහන් අනෙකුත් අවශ්‍යතා සපුරාලීම අවශ්‍ය වේ. වැඩි විස්තර සඳහා https://www.nhda.lk/index.php/en/about-usa/introduction පිවිසෙන්න.

**ආපසු පැමිණෙන අයවලුන් සඳහා ඇති අවස්ථාව**

**සුදුසුකම් සහ අවශ්‍යතා:**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) ලියාපදිංචි වී ඇති** සහ අවදානමට ලක්විය හැකි තත්ත්වයට පත්වී සිටින ආපසු පැමිණෙන්නන්ට තාවකාලික නවාතැන් සහ නවාතැන් පහසුකම් සැලසේ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ***සහන පියස*** "සුභසාධන මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන අතර එය කටුනායක ගුවන් තොටුපළට ආසන්නව පිහිටා ඇත.

බොහෝවිට නවාතැන් පහසුකම් ගැටුම්/ස්වාභාවික විපත් හේතුවෙන් විපතට පත් වූවන් හෝ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන් සඳහා සපයනු ලබන අතර ඒවා සාමාන්‍යයෙන් විවිධ රාජ්‍ය නොවන සංවිධාන සහ රජය විසින් පවත්වාගෙන යනු ලැබේ.

**ලියාපදිංචි වීමේ ක්‍රියා පටිපාටිය:** ශ්‍රී ලංකාව තුළ සමාජ නිවාස යෝජනා ක්‍රම නොමැත.

## 4.සමාජ සුභසාධනය

**සමාජ සුබසාධන ක්‍රමය:**
රජය විසින් ආරම්භ කරන ලද සමාජ සුබසාධන වැඩසටහන් කිහිපයක් තිබේ. රජය විසින් ක්‍රියාත්මක කරන ලද සමෘද්ධි වැඩසටහන මඟින් සුදුසුකම්ලත් කුටුම්භ සඳහා ආහාර මුද්දර ලබා දීම, ඉතුරුම් සහ ණය වැඩසටහන්, ව්‍යවසායකත්ව සහ ව්‍යාපාර සංවර්ධනය සඳහා අරමුණු කර ගත් ණය, ප්‍රජා යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය, මුදල් ආධාර ලබාදීම, සමාජ ආරක්ෂණ අරමුදල් සහ පෝෂණ වැඩසටහන ඇතුළත් සහන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. සමෘද්ධි වැඩසටහන තුළින් ආධාර ලබා දෙන්නේ සුදුසුකම් ඇති පුද්ගලයින්ට පමණි. පාසල් පෙළපොත්, නිල ඇඳුම් සහ ශිෂ්‍යත්ව ලබා දෙන ව්‍යවස්ථාපිත ප්‍රතිපත්තියට අනුව ශ්‍රී ලංකාව ළදරු පාසල් මට්ටමේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙනු ලැබේ. මීට අමතරව, සියලුම පුරවැසියන්ට නොමිලේ සෞඛ්‍ය සේවය සපයන පොදු සෞඛ්‍ය සේවා පද්ධතියක් ශ්‍රී ලංකාව සතුව ඇත. ළමුන්, අඩු ආදායම්ලාභී පවුල්, ආබාධිත සහ වැඩිහිටියන් සඳහා සමාජ සුබසාධන සේවා සපයන විවිධ රාජ්‍ය නොවන සංවිධාන සහ ආගමික ආයතන තිබේ.

**ආපසු පැමිණෙන අය සඳහා අවස්ථාව**

**සුදුසුකම් සහ අවශ්‍යතා:**

සමෘද්ධි වැඩසටහන අඩු ආදායම්ලාභී පවුල් සඳහා පමණක් සහය ලබා දෙන අතර සුදුසුකම් අදාළ ග්‍රාම සේවා නිලධාරියාවරයාගෙන් විමසන දැනගත යුතුය. වැඩි විස්තර https://www.samurdhi.gov.lk/web/index.php?lang=en මගින් ලබා ගත හැක.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය:** වැඩසටහන සඳහා ලියාපදිංචි වීම සමෘද්ධි වැඩසටහනේ බලධාරීන්, සහ ආපසු පැමිණෙන පුද්ගලයාගේ මූල්‍ය පසුබිම තක්සේරු සිදු කරනු ලබන ග්‍රාම සේවක නිලධාරි මහතා විසින් තීරණය කළ යුතු අතර ආපසු පැමිණෙන තැනැත්තාගේ සුදුසුකම් මත රඳා පවතී.

**අවශ්‍ය ලියකියවිලි**: ග්‍රාම සේවක මහතා විසින් නිකුත් කරන ලබන ආදායම තහවුරු කිරීමේ සහතිකය.

*ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාමට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති සංක්‍රමණිකයන් සඳහා සුබසාධන ක්‍රමයක් සකසා ඇත. වැඩි විස්තර සඳහා (http://www.slbfe.lk/page.php?LID=1&MID=39 වෙබ් අඩවිය පරිශීලනය කිරීමෙන් හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්ෂණික ඇමතුම් අංකය 1989 ඇමතීමෙන් ලබා ගත හැකිය.

## විශ්‍රාම වැටුප් ක්‍රමය

විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ වන්නේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා පමණි. රාජ්‍ය අංශයේ සේවකයින්ට මාසික පදනමින් ගෙවනු ලබන විශ්‍රාම වැටුප් අරමුදලක් ලැබෙන අතර පුද්ගලික අංශයේ සේවකයින්ට සේවක භාරකාර අරමුදල (ETF) යටතේ අතුරු ප්‍රතිලාභයක් සහ සේවක අර්ථසාධක අරමුදල (EPF) යටතේ විශ්‍රාම ප්‍රතිලාභයක් සඳහා අවස්ථාව හිමිවේ. පුද්ගලික අංශයේ සේවකයින් සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදලට හිමිකම් කියන අතර එක් සේවා යෝජකයෙකු යටතේ වසර පහක් හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව සේවය කර ඇති සේවකයින් පාරිතෝෂික ලබාගැනීම සඳහා ද සුදුසුකම් ලබයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අනුව 2023 ජනවාරි 01 වැනි දිනට ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවකයකුගේ විශ්‍රාම ගැන්වීමෙ වයස අවුරුදු 55කි. කෙසේ වෙතත් සිවිල් නිළධාරීන්ට අවශ්‍ය නම් වයස අවුරුදු 60 දී විශ්‍රාම ගැනීමේ නිදහස ඇත. සේවා නියුක්තිය වසර 10 ක් පැවතියේ නම් විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට සේවකයාට හිමිකම් ඇත. විශ්‍රාම ගන්නා සේවකයින් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන අතර අදාළ ආකෘති පත්‍ර සම්පූර්ණ කොට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් එම ප්‍රතිලාභ ලබා ගත හැකි අතර, විශ්‍රාමිකයාගේ මරණයෙන් පසු විශ්‍රාමිකයාගේ වැන්දඹුවට සහ අවුරුදු 26 ට අඩු රැකියා විරහිත අවිවාහක දරුවන්ට ප්‍රතිලාභ ලබා දෙන ලෙස ඉල්ලා සිටිය හැක. සමුපකාර සමිතිවල සේවකයින්, ගෘහ සේවකයින්, පුද්ගලික රියදුරන් හෝ පුද්ගලයින් 15 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටින ඕනෑම ආයතනයක සේවය අවසන් කිරීමට පෙර මාස 12 ක කාලය තුළ සේවකයින් ලෙස සේවයේ නියැලී සිටි අයවලුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් නොලැබේ. වැඩිදුර විස්තරhttps://www.pensions.gov.lk/index.php?option=com_content&view=article&id=17&Itemid=149&lang=en#about-foreign-pension-division හරහා ලබා ගත හැක. පුද්ගලික අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම ගැන්වීමේ වයස සේවකයා සහ සේවායෝජකයා අතර එකඟතාවයේ කොන්දේසි මත පදනම් වේ.

### ආපසු පැමිණෙන අය සඳහා අවස්ථාව

**සුදුසුකම් සහ අවශ්‍යතා:** ආපසු පැමිණෙන්නන් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් ලබා ගැනීමට සුදුසුකම් ලබන්නේ නම්, ආපසු එන තැනැත්තා විශ්‍රාම යාමෙන් පසු විශ්‍රාම වැටුප්, නැතහොත් සේවක අර්ථ සාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි. මෙය අදාළ වන්නේ ආපසු පැමිණෙන තැනැත්තා අදාළ කොන්දේසි සපුරා ඇත්නම් පමණි.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය:** විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා ලියාපදිංචිය සේවා යෝජකයා විසින් සිදු කරනු ලැබේ.

**අවශ්‍ය ලියකියවිලි:** අවශ්‍ය ලියකියවිලි පිළබඳව සේවා යෝජකයා විසින් උපදෙස් දෙනු ලබන අතර ශ්‍රී ලංකාවේ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

**අවදානමට ලක්විය හැකි කණ්ඩායම්**: ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රජාවන්, දෛනික වැටුප් ලබන ශ්‍රමිකයන්, කාන්තා ගෘහ මූලික නිවාස, ආබාධිත පුද්ගලයන්, ආපසු පැමිණි සංක්‍රමණිකයන් සහ ගෘහ සේවිකාවන් ලෙස සංක්‍රමණය වූ විදේශීය සංක්‍රමණික පවුල් වැනි අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් රාශියක් ශ්‍රී ලංකාවේ සිටිති. තම අවශ්‍යතාවයන් සඳහා ප්‍රවාහන ක්‍රමවේද භාවිතා නොකර බොහෝ දුර ගමන් කිරීමට සිදුවන බැවින් වඩා හොඳ යටිතල පහසුකම්, ප්‍රවාහනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම නිසා ග්‍රාමීය ප්‍රදේශවල පදිංචිව සිටින සහ වැඩ කරන ජනතාව ශ්‍රී ලංකාවේ දුෂ්කරතා රැසකට මුහුණ දෙති. ශ්‍රී ලංකාව නිදහස් සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් අනුගමනය කරන බැවින්, එයට සියලුම ප්‍රජාවන්ට ප්‍රවේශ විය හැකි අතර, ඔවුන් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුප් සඳහා සුදුසු රැකියාවක් යටතේ සේවය කර ඇත්නම් විශ්‍රාම වැටුප් සඳහා සුදුසුකම් ලබයි. ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහය දෙන බොහෝ සංවිධාන තිබේ. ආන්තික සහ අවවරප්‍රසාදිත ප්‍රජාවන්ට ස්වයංව තමන් රැක බලා ගැනීම සඳහා මෙන්ම, ඔවුන් ජාතික සංවර්ධනයේ ක්‍රියාකාරී කොටස්කරුවන් බවට පත් කිරීමට සහ ඔවුන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා රජය විසින් සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රජා පාදක පුනරුත්ථාපන වැඩසටහන් පැවත්වීම, ආබාධ සහිත පුද්ගලයින්ට වෘත්තීය පුහුණුව ලබා දීම, ආබාධ සහිත දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනයට සහාය වීම සහ මන්දමානසික දරුවන් රැකබලා ගැනීම යනාදී කටයුතු සිදුකරනු ලැබේ. වැඩි විස්තර සඳහා කරුණාකර https://www.socialservices.gov.lk/web/index.php?lang=en. බලන්න. සමාජ සුබසාධන, පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මධ්‍යම පළාතේ වැඩිහිටි, ආබාධිත ප්‍රජාව සහ ළමුන් සඳහා සහාය ලබා දෙයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය අවදානමට ලක්විය හැකි සංක්‍රමණිකයන් සහ සංක්‍රමණික ප්‍රජාවන්ට සහාය දක්වයි. මීට අමතරව, ශ්‍රී ලංකාවේ, Humanity & Inclusion, USAID,World Vision, Habitat for Humanity සහ එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ජීවනෝපාය සහය, නැවත සමාජයට ඒකාබද්ධ කිරීම, මනෝ සමාජීය සහය, මූල්‍ය ආධාර වැනි විවිධ ව්‍යාපෘති හරහා අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහාය දක්වන ප්‍රධාන සංවිධාන වේ.

**ආපසු පැමිණෙන අය සඳහා ඇති අවස්ථාව**

**සුදුසුකම් සහ අවශ්‍යතා**: අතිශයින් අවදානමට ලක්විය හැකි සහ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින නැවත පැමිණෙන්නන් රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සමෘද්ධි වැඩසටහනෙන් සහය ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ස්වෝත්සාහීව නැගටීමට සහ සමාජයට නැවත සම්බන්ධ වීමට කිසියම් නිපුණතාවක් වැඩිදියුණු කිරීමට කිසියම් සහයක් අවශ්‍ය නම් සමාජ සේවා දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ විය යුතුය. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ වෘත්තීය පුහුණුව ලබා ගැනීම සඳහා පුද්ගලයාගේ වයස 16 සිට 35 දක්වා විය යුතුය. අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය, USAID සහ වෙනත් සංවිධාන විසින් ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාපෘති හරහා හඳුනාගනමින් සහාය ලබා දෙනු ඇත.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය**: ආපසු පැමිණෙන්නන් සහය ලබා ගැනීමේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ඔවුන් පදිංචි ප්‍රදේශයේ අදාළ ග්‍රාම සේවක නිලධාරියාවරයා සම්බන්ධ කර ගත යුතුය.

**අවශ්‍ය ලියකියවිලි**: පදිංචිය තහවුරු කිරීම, ජාතික හැඳුනුම්පත, හෝ විදේශ ගමන් බලපත්‍රය

## 5. අධ්‍යාපනය

**අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය තොරතුරු:**
වයස අවුරුදු පහේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා සෑම දරුවෙකුටම නොමිලේ අධ්‍යාපනය ලැබෙන නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව අනුගමනය කරයි. මෙරට පැවති බ්‍රිතාන්‍ය යටත් විජිත සමය රටේ අධ්‍යාපන ක්‍රමයට විශාල බලපෑමක් එල්ල කර තිබේ. එබැවින් පාසල් විභාග සහ විෂයමාලා අන්තර්ගතය අ.පො.ස. සා.පෙළ සහ උසස් පෙළ මෙන් බ්‍රිතාන්‍ය විභාගවල ආකෘතියට සමාන තත්වයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ළමුන් වයස අවුරුදු 5 දී පාසල් අධ්‍යාපනය ආරම්භ

කරන අතර වයස අවුරුදු 16 දක්වා එය තුළ රැඳී සිටීම අනිවාර්ය වේ. භාෂා මාධ්‍ය ලෙස සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ක්‍රියාත්මක වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛණවලට අනුව නොමිලේ අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් 9931ක් සහ ගාස්තු මත පදනම් වූ පිළිගත් පෞද්ගලික පාසල් 98ක් තිබේ. නාගරීකරණය වූ ප්‍රදේශවල රජයේ පාසල්වලට ඇතුළුවීම තරඟකාරී ස්වාභාවයක් උසුලන අතර තදබදය පිළිබඳ ගැටලුවකට ද මුහුණ දෙයි. සාපේක්ෂ වශයෙන් බැලූ කල පුද්ගලික අංශය කුඩා වන අතර එම පාසල්වලින් අධ්‍යාපනය ලබා ගන්නේ සමාජයේ එක්තරා කොටසක් පමණි. ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රමාණවත් පාසල් ඇති නමුත් සම්පත්, වෙනත් පහසුකම් සහ ගුරු සංඛ්‍යාව යනාදියේ දැඩි විෂමතා දක්නට ලැබේ. එවැනි පාසල් පිහිටා ඇති ප්‍රදේශවල දක්නට ලැබෙන අඩු යටිතල, සෞඛ්‍ය සහ සනීපාරක්ෂක පහසුකම් හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට වඩාත් හොඳ අධ්‍යාපනයක් ලබාදීම පිණිස ප්‍රමාණවත් ගුරුවරුන් පිරිසක් ලබා ගැනීම ප්‍රධාන බාධාවක් ලෙස පවතී. රජයේ පාසල්වල ප්‍රාථමික පාසල් දරුවන්ට දිවා සුරැකුම් සඳහා වන පහසුකම් ලබා නොදෙන නමුත් මෙම සේවාව සපයන පෞද්ගලික පාසල් ද තිබේ.

**පිරිවැය, ණය සහ වැටුප:**
01 ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා අධ්‍යාපනය නොමිලේ ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ සම්මත කර ඇති නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය මගින් පෙළපොත් සහ නිල ඇඳුම් සඳහා වන වියදම් ද ආවරණය වන අතර අමතර පොත්පත්, සටහන් පොත් සහ ලිපි ද්‍රව්‍ය වැනි අනෙකුත් පාසල් අධ්‍යාපනය සඳහා වන අවශ්‍යතාවන් සිසුන් විසින් සම්පාදනය කර ගත යුතු වේ. රජයේ පාසල් බොහොමයක් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සපයන අතර පෙළපොත්, නිල ඇඳුම් ද සපයා දෙනු ලැබේ. එමෙන්ම අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ සිසුන්ට උපකාර කිරීම සඳහා සහනදායී ප්‍රවාහන සහ සෞඛ්‍ය සේවා වැනි අනෙකුත් සුභසාධන ප්‍රතිලාභ ද ලබා දෙනු ලබයි. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සහ අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කර ඇති පරිදි ඉහළ ලකුණු ලබා සමත් වන සිසුන්ට පහසුකම් සහ සම්පත්වලින් හෙබි සංසන්දනාත්මකව වඩා හොඳ තත්වයක තිබෙන බව සැලකෙන නාගරික ප්‍රදේශයක රජයේ පාසලකට ඇතුලත් වීමට අවස්ථාව ලැබේ. අ.පො.ස උසස් පෙළින් ඉහළ ලකුණු ලබා ගන්නා සිසුන්ට නොමිලේ අධ්‍යාපනය ලැබෙන රාජ්‍ය විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට ඉඩ ප්‍රස්ථාව ලැබේ. අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ. පෞද්ගලික අංශයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන සිසුන්ට අධ්‍යයනය සඳහා වාර ගාස්තු ගෙවීමට සිදුවන අතර සමහර සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයනයේ කාර්ය සාධනය මත ශිෂ්‍යත්ව හෝ අඩු ගාස්තු සඳහා සහන ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ සිසුන්ගේ උසස් අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා බැංකු විසින් ලබා දෙන අධ්‍යාපනික ණය බොහොමයක් ද තිබේ.

**විදේශීය ඩිප්ලෝමා අනුමත කිරීම සහ සත්‍යාපනය කිරීම**
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් නිකුත් කරනු ලබන පිළිගැනීමේ ලිපිය මත පදනම්ව විදේශීය උපාධි/ඩිප්ලෝමා සහ විදේශයන්හි ලබාගත් සහතික අනුමත කිරීම සහ සත්‍යාපනය කිරීම ශ්‍රී ලංකාව තුළ පිළිගනු ලැබේ. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන්, එවැනි සත්‍යාපනය සඳහා වන ඉල්ලීම් පිළිගනු ලබන්නේ අන්තර්ජාලය හරහා පමණක් වන අතර පිළිගැනීමේ ලිපි අන්තර්ජාලය හරහා ද නිකුත් කෙරේ. අයදුම්පත අන්තර්ජාලය ඔස්සේ ලබා ගත හැකි අතර, ගෙවීම් අන්තර්ජාලය හරහා සිදු කළ හැකිය. එසේ නොවේ නම් අවශ්‍ය ලේඛන සහිත ඉල්ලීම් ලිපිය recog@ugc.ac.lk වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. විදේශීය විශ්වවිද්‍යාල විසින් පිරිනමනු ලබන එක් උපාධියක්/ඩිප්ලෝමාවක් පිළිගැනීම සඳහා රු. 2500 අයකරන අතර වෙනත් සුදුසුකමක් සඳහා වූ පිළිගැනීමක් සඳහා එක් සහතිකයක් සඳහා රු. 2000 බැගින් අයකරනු ලැබේ. වැඩිදුර විස්තර සඳහා, කරුණාකර https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=1741%3Apayment-gateway&catid=144%3Apayment-gateway&Itemid=92&lang=en බලන්න.

**ආපසු පැමිණෙන අය සඳහා අවස්ථාව**
**සුදුසුකම් සහ අවශ්‍යතා:** ආපසු පැමිණෙන අයට අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය වී ඕනෑම රජයේ හෝ පෞද්ගලික පාසලකට ඇතුළත් විය හැකිය. රජයේ පාසලකට යාමට තීරණය කළහොත් ආපසු පැමිණෙන අයට නොමිලේ අධ්‍යාපනය සඳහා හිමිකම් ලැබේ. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය හෝ අ.පො.ස. සා.පෙළ විභාගයෙන් ඉහළ ලකුණු ලබා සමත් වුවහොත්, ආපසු පැමිණෙන අය වැඩි පහසුකම් සහ සම්පත් සහිත වඩා හොඳ රජයේ පාසලකට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි. මීට

අමතරව, අ.පො.ස උසස් පෙළ විභාගයෙන් ඉහළ ලකුණු ලබා සමත් වුවහොත් නැවත පැමිණෙන අය රාජ්‍ය විශ්වවිද්‍යාලයකට සුදුසුකම් ලබනු ඇත. ඔවුන් කැමැත්තක් දක්වන්නේ නම් සහ ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් තිබේ නම්, ආපසු පැමිණෙන අයට පෞද්ගලික පාසල්වලට ද ඇතුළත් විය හැකිය.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය**: ආපසු පැමිණෙන්නන් ලියාපදිංචි වීමට/ඇතුලත් වීමට අදාළ පාසල් බලධාරීන් හෝ පෞද්ගලික විශ්වවිද්‍යාලය හා සම්බන්ධ විය යුතුය.

**අවශ්‍ය ලියකියවිලි:** වලංගු හැඳුනුම් ලේඛනයේ පිටපතක් (ජාතික හැඳුනුම් පත/ විදේශ ගමන් බලපත්‍රය), 'ග්‍රාම සේවක' නිලධාරියා විසින් නිකුත් කරන ලද සහතිකය, ලබාගත් අධ්‍යාපනය අදාල ප්‍රතිඵල ලේඛණ, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබාගත් සමානතා සහතිකය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු පිළිගැනීමේ ලිපිය.

# 6. ළමුන්

**ළමුන් සහ ළදරුවන්ගේ සාමාන්‍ය තත්වය:**

පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකාව දරුවන්ගේ එදිනෙදා ජීවිතය නඟා සිටුවීමේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, දිගුකාලීන යුද්ධයක්, ස්වභාවික විපත් සහ දේශපාලන ගැටුම්වල බලපෑම් මධ්‍යයේ වුවද, දරුවන්ගේ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා රට හොඳින් කටයුතු කර ඇත. බොහෝ පවුල් අන්ත දරිද්‍රතාවයෙන් මිදීමට සමත් වී ඇති අතර, වයස අවුරුදු පහට අඩු මරණ අවම කිරීමට සහ නිසි පෝෂණය සහ ප්‍රසව ප්‍රතිකාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමට, ජල හා සනීපාරක්ෂක පහසුකම්වල ගුණාත්මකභාවය සහ ආවරණය වැඩි දියුණු කිරීමට සහ දරුවන්ට නොමිලේ අධ්‍යාපනය ලබා දීමට බොහෝ උත්සාහයන් ගෙන ඇත. ශ්‍රී ලංකාවේ නොමිලේ ලබාදෙන සෞඛ්‍ය සේවාව යටතේ බොහෝ දරුවන් ප්‍රතිලාභ ලබා ඇත. කෙසේ වෙතත්, විශේෂයෙන් උතුරු, නැගෙනහිර, කඳුකරයේ සහ ග්‍රාමීය ප්‍රදේශවල තවමත් අතිශය දිළුඳුකමක් පවතී. ළදරු හා වයස අවුරුදු පහට අඩු මරණ, මන්දපෝෂණය සහ රෝග නිවාරණ හා ප්‍රතිකාර ආශ්‍රිත සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමේදී දක්නට ලැබෙන අසමානකම් වැනි අභියෝගවලට මුහුණ දෙන අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් දැක ගත හැක. ශ්‍රී ලංකාව 1992 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC)අපරානුමත කරන ලද අතර එතැන් සිට රජය ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සැලකිය යුතු ක්‍රියාමාර්ග ගෙන ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පිහිටුවන ලදී. සෑම වසර පහකට වරක් ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහන් කරමින් ශ්‍රී ලංකාව ද CRC කමිටුවට තම වාර්තාව ඉදිරිපත් කරයි. සෞඛ්‍ය අමාත්‍යාංශය, ළමා සෞඛ්‍ය නංවාලීම සඳහා ප්‍රතිශක්තිකරණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

**දරුවන්ගේ යහපැවැත්ම සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්:**

සේව් ද චිල්ඩ්‍රන්, චයිල්ඩ් එක්ෂන් ලංකා, *PEaCE/ECPAT,* ෆ්‍රෙන්ඩ්ස් ලංකා, චයිල්ඩ් ෆවුන්ඩේෂන් සහ ලීඩ්ස් (*Save the Children, Child Action Lanka, PEaCE/ECPAT Sri Lanka, Friends Lanka Child Foundation and LEADS)* වැනි ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා කැපවී සිටින රාජ්‍ය නොවන ආයතන බොහෝමයක් රට තුළ ක්‍රියාත්මක වේ. මීට අමතරව, යුනිසෙප් (UNICEF) ආයතනය විසින් වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ දරුවන්ගේ අභිවෘද්ධිය සහ යහපත් අනාගතයක් සඳහා මුලපුරමින් සිටියි. මෙම සංවිධානවල පරමාර්ථය වන්නේ දරුවන්ට නිරෝගී ජීවිතයක් ලඟා කර ගැනීම, ඉගෙනීමට අවස්ථාව ලබා දීම සහ දරුවාට සිදුවිය හැකි හානිවලින් ආරක්ෂා කරගැනීම යනාදිය සඳහා සහය වීමයි. දරුවන්ගේ පැවැත්ම, සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා පරිසරයක් ගොඩනැගීමට ඔවුන් කැපවී සිටිති.

**ආපසු පැමිණෙන අය සඳහා අවස්ථාව**

**සුදුසුකම් සහ අවශ්‍යතා:** දරුවන් ආපසු පැමිණෙන විට ඔවුන්ගේ ජාත්‍යන්තර උප්පැන්න සහතිකය, එන්නත් වාර්තාව, අධ්‍යාපන වාර්තා සහ ඖෂධ වාර්ථා තිබිය යුතුය. දරුවා පාසලකට ඇතුළත් කිරීමට සිදු වූ විට මෙම වාර්ථා ඉල්ලා සිටිනු ඇත.

**ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය:** අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රජයේ පාසල්වලට 01 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා කාලසීමාවන් නියම කර ඇති අතර එය අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන *https://moe.gov.lk/* සහ පුවත්පත්වල පලකර ඇත. 2 ශ්‍රේණිය හෝ 6 ශ්‍රේණිය වැනි අධ්‍යාපන ක්‍රියාවලියේ අතර මග කාලයක රජයේ පාසලකට ඇතුළත් කර ගැනීම සඳහා අදාළ පාසල් බලධාරීන් සමග සාකච්ඡා කළ යුතුය.

**අවශ්‍ය ලියකියවිලි:** විදේශගතව සිටි කාලය තහවුරු කිරීම, විදේශගත වීමට හේතු, දෙමාපියන්ගේ ඡන්ද හිමි නාමලේඛන ලියාපදිංචි කිරීම, උප්පැන්න සහතිකය, පදිංචි ස්ථානය තහවුරු කරන ග්‍රාම නිලධාරී සහතිකය, පෙර අධ්‍යාපන සහතික.

## 7. සබඳතා

**සංක්‍රමණිකයින් සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලය- එක්සත් ජාතීන්ගේ සංවිධානය**

අංක 86 ª, ඇල්විටිගල මාවත
කොළඹ 08
ශ්‍රී ලංකාව
0115 325 300
iomcolombo@iom.int
https://srilanka.iom.int/

නැවත පැමිණීම සහ ප්‍රතිවයුහගත කිරීම සඳහා වු විමසීම් සඳහා පහත අංකය අමතන්න
ගයනි මීගමුගෙ
gmeegamuge@iom.int
0774410371

ගොඩ්වින් පේර්කින්ස්
0773028413
aperkins@iom.int

**සෞඛ්‍ය අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව**
සුවසිරිපාය
අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10
0112 694 033 0112 675280
postmaster@health.gov.lk
http://www.health.gov.lk/moh_final/english/

**සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය**
02 කිංසි පාර
කොළඹ 01
healthpromo@sltnet.lk
https://www.hpb.health.gov.lk/en#suwasariyaCall

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
ප්‍රධාන කාර්යාලය - අංක 234
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල
0112 879900-02 ක්ෂණික ඇමතුම් - 1989

Infor_center@slbfe.lk
http://www.slbfe.lk/

**ශ්‍රී ලංකා වෘත්තීය මාර්ගෝපදේශන ආයතනය**
ජාතික තරුණ සේවා සභා පරිශ්‍රය
හයිලෙවල් පාර
මහරගම
+94 011 2333467
http://slicg.gov.lk/slicg/

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

4 වන මහල, සෙත්සිරිපාය
බත්තරමුල්ල
0112 887722
සේනක උබේසිංහ මහතා (තොරතුරු/මාධ්‍ය නිලධාරී)
Senaka.ubesinghe@gmail.com
https://www.samurdhi.gov.lk/web/index.php/en/home.html

**ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය**

ඉසුරුපාය, බත්තරමුල්ල
පන්නිපිටිය පාර
බත්තරමුල්ල 10120
0112 785 141
info@moe.gov.lk
https://moe.gov.lk/

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය**
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 1826
කොළඹ 02
011 2431932
info@nhda.lk
www.nhda.lk

**ජාතික ආධුනික සහ කාර්මික පුහුණු අධිකාරිය**
**පුහුණු මධ්‍යස්ථානය**
971 ශ්‍රී ජයවර්ධනපුර මාවත
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
0112 888 782
info@naita.gov.lk
http://www.naita.gov.lk/

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය**
පුහුණු මධ්‍යස්ථානය
4 වන මහල, නිපුනතා පියස
354/2
ඇල්විටිගල මාවත
කොළඹ

0112 352 190
cgjp@vtasl.gov.lk
https://www.vtasl.gov.lk/

## සැකෙවින්

### ආපසු පැමිණීමට පෙර ගත යුතු ක්‍රියාමාර්ග:

**සෞඛ්‍යය**: සෑම කෙනෙකුගේම එන්නත් වාර්තා රැගෙන ආ යුතු අතර, එය ඉංග්‍රීසි බසින් නොතිබෙන්නේ නම් එය පරිවර්තනය කර සහතික කළ යුතුය. ආපසු පැමිණෙන පුද්ගලයා කිසියම් ඖෂධයක් හෝ ප්‍රතිකාරයක් ලබාගෙන ඇත්නම් වෛද්‍යවරුන්ගෙන් සියලුම වෛද්‍ය වාර්තා ලබා ගන්න. පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් දැනට රට තුළ විශාල ඖෂධ හිඟයක් පවතින බැවින් ශ්‍රී ලංකාව තුළ ඖෂධ සහ ප්‍රතිකාර තිබේදැයි පරීක්ෂා කරන්න.

**අධ්‍යාපනය**: ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර අදාළ බලධාරීන් විසින් සහතික කර ඇති උපාධි/ඩිප්ලෝමා වෙනත් අධ්‍යාපන සුදුසුකම් සහතික ඔබ ළඟ තබා ගන්න. අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීමට අදාල ලිපියක් ඉල්ලා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඒවා යොමු කරන්න.

**අනන්‍යතා තහවුරු කිරීමේ ලියකියවිලි**: සංචාරක ලේඛනය වලංගු බව සහතික කර ගන්න. එසේ නොමැති නම් වැඩිදුර උපදෙස් සඳහා ළඟම ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලය අමතන්න. විදේශ ගමන් බලපත්‍රය සහ ජාතික හැඳුනුම්පත තිබේ නම් රැගෙන එන්න. ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් නීත්‍යානුකූල කරන ලද සහතික කළ උප්පැන්න සහතිකයක් ලබා ගන්න. රටින් පිටත උපත ලබන දරුවන්ගේ පුරවැසිභාවය උපත ලැබීමෙන් වසරක් ඇතුළත ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. ලියාපදිංචි වීමට අපොහොසත් වුවහොත් අමතර ගාස්තු අය කෙරේ.
**පවුලේ අය සහ මිතුරන්**: පවුලේ ළඟම නෑයන්ට සහ සහ මිතුරන්ට ඔබගේ පැමිණීම ගැන දැනුම් දීමට වග බලා ගන්න, එවිට පහසුවෙන් නැවත පැමිණීම සඳහා අවශ්‍ය සහයෝගය සහ සම්බන්ධීකරණය ලබා ගත ගත හැකිය.

**ප්‍රවාහනය**: කලින් පදිංචි ස්ථානයට යාමට කුලී රථයක් වෙන්කරවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රවාහන කටයුතු සම්බන්ධීකරණය කර ගන්න. ප්‍රවාහනය සඳහා ගෙවීමට මෙන්ම ඔබගේ ගමන අතරතුර ඇති වන අවශ්‍යතාවයන් සඳහා ඔබ සතුව ශ්‍රී ලංකාවේ මුදල් ඇති බවට තහවුරු කර ගන්න.

**රැකියාව**: ඔබ සත්කාරක රටේ සේවය කර ඇත්නම් හෝ කිසියම් පුහුණුවක් හෝ ආධුනිකත්වයක් ලබා ඇත්නම්, පළපුරුද්ද තහවුරු කරන ලිපියක් කරුණාකර ලබා ගන්න.

**නවාතැන් පහසුකම්**: නවාතැන් පහසුකම් පිළිබඳ තොරතුරු අඩංගු වෙබ් අඩවි වෙත යොමු වී ශ්‍රී ලංකාවේ නවාතැන් පහසුකම් ගැන අදහසක් ලබා ගන්න. පවුලේ අයගේ හෝ මිතුරන්ගේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ තාවකාලික නවාතැන් පහසුකම් කල්තබා සූදානම් කර ගන්න.

**සැලසුම් කිරීම**: වත්මන් ආර්ථිකය සහ සමාජ සන්දර්භයන්, පවතින රැකියා අවස්ථා අවබෝධ කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව පිළිබඳ කෙටි පර්යේෂණයක් කරන්න.

### පැමිණීමෙන් පසු ගත යුතු ක්‍රියාමාර්ග:

**හැඳුනුම් ලේඛන**: ඔබ සතුව ජාතික හැඳුනුම්පතක් නොමැති නම්, ඒ සඳහා අයදුම් කර අදාළ බලයලත් ආයතනයේ ලියාපදිංචි වන්න.

**බැංකු ගිණුම**: ශ්‍රී ලංකාවේ ඔබ කැමති බැංකුවක බැංකු ගිණුමක් විවෘත කරන්න. ඒ සඳහා ඔබගේ ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය අවශ්‍ය වේ.

**නැවත සමාජයට ඒකාබද්ධ කිරීම**:නැවත ඒකාබද්ධ කිරීමේ සහාය ලබා ගැනීමට සුදුසුකම් ඇත්නම් ඔබ පැමිණි විගස ඒ සඳහා ලබා දී ඇති කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ අදාළ සංක්‍රමණිකයින් සඳහා වන ජාත්‍යන්තර කාර්යාලය අමතන්න, ඔබ කාර්යාලයට පැමිණීමට පෙර කාර්යාලය අමතා වේලාවක් වෙන් කර ගන්න.